# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2360/75 – 2023 දෙසැම්බර් මස 02 වැනි සෙනසුරාදා – 2023.12.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, අකුරැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දිගනහේන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිගනහේන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක MR/AKR/2017/62 හා 2017.04.28 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'A' - හුලංදාව වත්ත - ප්‍රමාණයඃ හෙක්. **0.1012ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: වතු අධිකාරි විසින් හිමිකම් කියනු ලබන හුලන්දව වතුයාය - තේ වගාව; දකුණට: වතු අධිකාරි විසින් හිමිකම් කියනු ලබන හුලන්දව වතුයාය - තේ වගාව සහ පාර; බටහිරට: පාර සහ වතු අධිකාරි විසින් හිමිකම් කියනු ලබන හුලන්දව වතුයාය - තේ වගාව.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය - 4-3/8/2016/PC/547.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.
2023 අගෝස්තු මස 31.

EOG 12 - 0019